**ශීර්ෂය 116 - වෙළඳ අමාත්‍යාංශය**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 06 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**------------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 116-01-02-1202 දරන වැය විෂයට හර කල යුතු ඉන්ධන වියදම් රු.351,407ක් , අංක 116-01-02-1409 සහ අංක 116-1-2-1205 දරන වැය විෂයයන්ට හර කර තිබුණි. ඒ අනුව එම ප්‍රමාණයෙන් ඉන්ධන වියදම අඩුවෙන් හා වෙනත් වියදම වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | 2187/27 අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2020.08.09 දින මෙම අමාත්‍යාංශය ස්ථාපිත කල අතර 2020 විගණන වාර්තාවේ පෙන්වා ඇති පරිදි ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයෙහි තනතුරුවල පුරප්පාඩු පැවතීම හේතුවෙන් මෙම අඩුපාඩු සිදු වී ඇති අතර ඉදිරියේදී මෙම වැරදි සිදු නොවීමට උපදෙස් දී ඇත. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 116-01-02-1301 වාහන අළුත්වැඩියා වියදම යටතේ ගිණුම්ගත කළ යුතු රු.259,938 ක වියදම 116-01-02-1409 වාහන නඩත්තු වියදම යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වාහන නඩත්තු වියදම වැඩියෙන් හා වාහන අළුත්වැඩියා වියදම අඩුවෙන්. මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මෝටර් වාහන වල පිරිවැය වශයෙන් රු. 79,900,500 ක් දක්වා තිබුණද , විගනණය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව රු.80,400,000 ක් වූයෙන් රු. 499,500 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වටිනාකම තුල අංක WP PF-0051 දරන වාහනයේ වටිනාකම රු.6,000,000 ක් විය යුතු අතර එම වටිනාකම මගහැරී ඇත. එසේම WP CAS-2163 යන රථයෙහි 2021.12.31 දිනට වටිනාකම රු.28,500,500 කි. එය මෙම වර්ෂයේ රක්ෂිත වටිනාකම ලෙස ප්‍රත්‍යාගණිත වටිනාකම රු.35,000,000 කි. ඒ අනුව 2021.12.31 දිනට මෝටර් වාහන වල පිරිවැය සත්‍ය වශයෙන්ම 79,500,500 ක් වේ. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මෝටර් වාහන වල පිරිවැය නිවැරදිව දැක්විය යුතුය. |

### 1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ ශේෂය 17,671,336 ක් වුවත් අත්තිකාරම් බී ගිණුමේ කේවල ශේෂ ලැයිස්තුව අනුව ශේෂය රු.17,767,595ක් විය. ඒ අනුව රු.96,259 ක් වැඩියෙන් කේවල ශේෂ ලැයිස්තුවේ දක්වා තිබුණි. | 2021 අප්‍රේල් මස රු.26,259/- ක ආපදා ණය, නිවාස ණය, දේපළ ණය වල පොලී වැරදීමකින් 116012 ට බැර කර තිබීම හා 2021 අප්‍රේල් මස ගෙවන ලද උත්සව අත්තිකාරම් ගෙවීම රු.70,000/- ක මුදල සටහන් නොවීම යන හේතුවෙන් මෙම වෙනස හටගෙන ඇති අතර, 2022 ජනවාරි හා පෙබරවාරි මස ගිණුම් සාරාංශය මගින් මෙම වරද නිවැරදි කර ඇත. | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය අත්තිකාරම් බී ගිණුමේ කේවල ශේෂ ලැයිස්තුව සමග සැසඳිය යුතුය. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මේ වන විට බැරකම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වැය විෂයයන් 05 ක් සදහා සලසා තිබුණු රු. 4,900,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | රාජ්‍ය වියදම් කලමනාකරණය තුලින් අත්‍යාවශ්‍ය වියදම් පමණක් දැරීම සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අක්මුදල් නිදහස් නොකිරීම මේ සදහා හේතු වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය . |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැඩ සටහන් 01 හි වැය විෂයයන් 06 ක් සඳහා රු. 43,000,000 ක් සහ වැඩ සටහන් 02 හි වැය විෂයයක් සඳහා රු. 1,050,000,000 ක් වශයෙන් රු. 1,093,000,000 ක් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. එය එක් එක් වැය විෂයයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට සියයට 223 දක්වා වූ පරාසයක පැවතුණි. | අමාත්‍යාංශය නව ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීම හේතුවෙන් අමාත්‍යාංශ සංදේශයක් මගින් අමතර ප්‍රතිපාදන ලබා ගැනීම ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත පරිපූරක ප්‍රතිපාදන ලබා ගැනීම, පුහුණුව ලද උපාධිධාරීන් ස්ථිර වීම මත වැටුප් ගෙවීම සඳහා අතිරේක ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම, ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා ප්‍රමාණවත් නොවීම සහ සතොස හා ලංකා සතොස ආයතන මගින් ලබා ගත් ණය මුදල් මුල්‍යයණයට අවශ්‍ය ප්‍රතිපාදන වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු විය. | -එම- |
| (ඇ) | වැය ශීර්ෂය යටතේ වැඩසටහන් 01 හි වැය විෂයයන් 10 ක් සඳහා රු. 15,610,300 ක් වීරමොං පරිපාටිය යටතේ අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. එය එක් එක් වැය විෂයයේ ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට සියයට 258 දක්වා පරාසයක් ගෙන තිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත වෙනත් වැය විෂයන්වලින් මාරු කිරීමට සිදු විය. | -එම- |
| (ඈ) | 2021 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් 116-2-5-3-2202 වැය විෂයය සඳහා ප්‍රතිපාදන වෙන් කර ගෙන නොතිබුණු අතර ඒ සඳහා 116-2-5-1-2202 වැය විෂයයෙන් මු.රෙ 66/69 මාරුකිරීම යටතේ රු.45,500,000 ක් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | මන්නාරම දිස්ත්‍රික්කයේ තාරපුරම් ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ශ්‍රවනාගාරය ඉදි කිරීම, තාරපුරම් වැඩ ආශ්‍රිත සංවර්ධන කටයුතු සිදු කිරීම හා සම්මේලන මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාලව තවදුරටත් රු.45,438,332.60 ක බිල්පත් ගෙවීමට තිබු අතර,ඒ සඳහා ප්‍රතිපාදන 2021 වර්ෂයේ අයවැය මගින් වෙන් වී නොතිබූ බැවින් , මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරු කරන ලදී. | -එම- |
| (ඉ) | පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන විශේෂයෙන් සඳහන් කල කාර්යයන්ට හැර වෙනත් අරමුණු සඳහා නොයෙදවිය යුතු අතර මු.රෙ. 66/69 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු | 116-1-2-0-1003 වැය විෂය සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ප්‍රතිපාදන සලසා ගන්නා ලදී. | පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන විශේෂයෙන් සඳහන් කල කාර්යයන්ට හැර වෙනත් අරමුණු සඳහා නොයෙදවිය යුතු අතර මු.රෙ. 66/69 යටතේ වෙනත් වැය |

| | | |
|---|---|---|
| නොකල යුතු වේ. එහෙත් ඊට පටහැනිව 116-1-2-0-1003 වැය විෂයය සඳහා රු.4,250,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන ඉන් රු.2,238,500ක් මු.රෙ.66 මාරු කිරීම මඟින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | | විෂයයන්ට මාරු නොකල යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ බැදීම් සහ බැරකම් නොමැති බව සඳහන් කර තිබුණද , 2022 වර්ෂයේ ගෙවීම් සම්බන්ධ නියැදි පරීක්ෂාවේදී 2021 වර්ෂයට අදාල රු. 3,481,619 ක බැරකම් 2022 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වූ බැවින් 2021 වර්ෂයට අදාළ ගෙවීම් 2022 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවලදී ගෙවා ඇත. ඉදිරියේදී නිවැරදිව වාර්තා කිරීමට උපදෙස් දී ඇත. | බැදීම් සහ බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් සහ බැරකම් පිළිබද ප්‍රකාශයේ දැක්විය යුතුය. |
| (ආ) වැය විෂයන් 5ක් යටතේ ඉතිරිය ඉක්ම වූ බැරකම් රු. 3,212,273 ක් පැවති අතර මේ සම්බන්ධයෙන් මු.රෙ 94 ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | -එම- | ඉතිරිය ඉක්ම වූ බැරකම් සම්බන්ධයෙන් මු.රෙ 94 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2021 වර්ෂයේ ලී බඩු උපකරණ මිළදී ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවිය යුතු රු.2,018,780 ක මුදල 2022 පෙබරවාරි 28 දින වන විටත් ගෙවා නොතිබුණු අතර එය බැරකම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ගෙවිය යුතු මුදල් බැරකම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | අමාත්‍යවරයාගේ සහ අමාත්‍යවරයාගේ සහය කාර්ය මණ්ඩල වෙනුවෙන් භාවිතා කල හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව 08ක් වුවද අමාත්‍යාංශය විසින් ඒ සඳහා නිල වාහන 11 ක් යොදවා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යවරයා සඳහා භාවිතා කල හැකි උපරිම වාහන සංඛ්‍යාව ඉක්මවා වාහන ලබා දී නොමැති අතර වාහන අලුත්වැඩියාව සිදුවන අවස්ථා වලදී ඒ වෙනුවට ලබා දී ඇති වාහන ගණන අනුව මෙම ගණනය කිරීම සිදුකර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයේ සටහන (viii) හි, 2015 ඔක්තෝබර් 23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස් වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම පිළිබඳ 2021.12.31 දිනට තත්ත්ව වාර්තාවේ, අමාත්‍යාංශයට අදාල බැංකු ගිණුම පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි. | භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ 2015/03 අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | 2021.12.31 දිනට තත්ත්ව වාර්තාවේ, අමාත්‍යාංශයට අදාල බැංකු ගිණුම පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශයේ අරමුණු අතුරින් පහත දැක්වෙන ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම. | ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියේ යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විටත් සිදුවන අතර එමඟින් මෙම අරමුණු ඉටුකර ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. | අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම. | රජයේ ගිණුම් කාරක සභාවෙන් ලද උපදෙස් මත දත්ත පද්ධතියක් යාවත්කාලීන කිරීම හා ඒ සම්බන්ධව කටයුතු කරගෙන යාමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | -එම- |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම ප්‍රධාන කාර්යයන් ලෙස හඳුනාගෙන තිබුණ ද පසුගිය වර්ෂයන් තුළ දෙපාර්තමේන්තුව විසින් සහල් සංචිතයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. 2021 වර්ෂයේදී දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ අවශ්‍යතාවය මත ශ්‍රී ලංකාව තුල සහල් මෙට්‍රික් ටොන් 8000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම සඳහා රු.මිලියන 200 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත සපයා තිබුණි.කෙසේ වෙතත් 2021 | 2021 වර්ෂයේ සහල් සඳහා රජය විසින් පාලන මිලක් පැන වූ අතර, පසුව රජය විසින් එම පාලන මිල ඉවත් කිරීමත් සමඟ දේශීය වෙළඳපල තුළ සීඝ්‍ර සහල් මිළ ඉහළ යාමක් සිදු විය .මෙයට පිළිතුරක් ලෙස සහල් ආනයනය සඳහා යෝජනා වූ අතර, ආරක්ෂිත සහල් තොගයක් තබා ගැනීම සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ රුපියල් මිලියන **200**ක ප්‍රතිපාදන , රාජ්‍ය වානිජ (විවිධ) නීතිගත සංස්ථාව | රටතුල සහල් සංචිතයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| ඔක්තොබර් මාසය දක්වාත් ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම සඳහා මෙම ප්‍රතිපාදනය උපයෝගී කර නොගැනීම හේතුවෙන් මෙම ප්‍රතිපාදනය රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත මාරු කර තිබුණි. මෙම කාර්යය 2021 වර්ෂයේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඉටුකර ගැනීම සඳහා සැලසුම් කල කාර්යයක් වුවද රටතුල සහල් සංචිතයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මගින් සහල් ආනයනය කරවා සතොස හරහා රට පුරා බෙදා හැරීම සඳහා රාජ්‍ය වානිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ලබා දෙන ලදී. ඒ තුළින් රට තුළ සහල් සුලභතාවය ඇති කර සහල් මිල පාලනය අපේක්ෂා කරන ලදී. රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත ලබා දෙන ලද මෙම මුදල් නැවත ආහාර කොමසාරිස් වෙත අයකර ගැනීම සඳහා නියමිතව පවතී. | |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට අයත් ගබඩා 13 ක් නවීකරණය කිරීම සඳහා සංස්ථාව විසින් රු.82,525,681 ක් වැය කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.62,490,367 ක වියදම් ප්‍රතිපූරණය කර තිබුණි.<br>මෙම සියළුම ගබඩා නවීකරණය කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය 2019 වසරේ සිදුකර තිබුණු අතර කොන්ත්‍රාත් කාළය දින 30 සිට දින 180 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.කෙසේ වුවද 2022 අප්‍රේල් 30 දින වන විටත් ගබඩා 06 ක නවීකරණ කටයුතු අවසන් වී තිබුණු අතර අනෙකුත් ගබඩා 07හි නවීකරණ කටයුතු වල ප්‍රගතිය 05% සිට 95% දක්වා වී තිබුණි. ප්‍රතිපාදන ලබා දී වසරකට අධික කාලයක් ගත වන තුරුත් මෙම ගබඩා නවීකරණ කටයුතු අවසන් නොකිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අධීක්ෂණ කාර්යය සිදුවී නොතිබුණි. | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ උපදෙස් අනුව අදාල ආයතනවලට මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ව්‍යාපෘති සම්බන්ධ අධීක්ෂණ කාර්යය නිසි ලෙස ඉටු කළ යුතුය. |

**3.4 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුල කාර්යාල උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අතර 5.6 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර සකස් කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්රහයේ 3.4.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව වහාම ලබාගතහැකි වටිනාකමින් අඩු භාණ්ඩ මිලදී ගැනීම සඳහා වන ප්රසම්පාදන ක්රමය සඳහා වෙළෙඳපොල මිල සැදහුම් ක්රමය අනුගමනය කල යුතු වුවත් අමාත්යාංශය විසින් මිලියන 03 ඉක්ම වූ ඉහත මිලදී ගැනීම සඳහා වෙළෙඳපොල මිල සැදහුම් ක්රමය අනුගමනය කර තිබුණි. | -එම- | -එම- |
| (iii) දෙවන අදියරේ කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා තිබුණු අතර රු.4,380,559ක කාර්යාල උපකරණ මිලදීගත් ආයතනය අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවීය. | -එම- | අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවිය යුතුය. |

| | | |
|---|---|---|
| (iv) ශ්‍රවණාගාරය සඳහා පුටු මිලදී ගැනීමට ලංසු කැඳවා නොතිබුණු අතර ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සැපයුම්කරුවෙකු නිර්දේශ කර තිබුණි.මේ සඳහා රු.3,289,500ක් වැය වී තිබුණු අතර මෙය ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව කල මිලදී ගැනීමක් බව නිරීක්ෂණය විය. | -එම- | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) අමාත්‍යාංශ කාර්යාලයෙහි අභ්‍යන්තර නිර්මාණකරණය හා කාර්යාල වෙන් කිරීම් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) 116-1-2-0-2001 යටතේ උක්ත කාරණය ඉටුකර ගැනීම සඳහා රු.22,000,000 ක් පමණක් ප්‍රතිපාදනය කර තිබුණද අමාත්‍යාංශය විසින් එම සීමාව ඉක්මවා රු.35,032,625 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. | මේ සඳහා අතිරේක ප්‍රතිපාදන රු.මි.20ක් සපයාගෙන තිබුණි.රු.35,032,625 ක වටිනාකමකට පිළියෙළ කර ඇත්තේ ඇස්තමේන්තුවකි. නමුත් වෙන්කර ඇති ප්‍රතිපාදන තුල වියදම් දරා ඇත. | ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමේදී ප්‍රතිපාදන ප්‍රමාණය සම්බන්ධයෙන් සැළකිලිමත් විය යුතුය. |
| (ii)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (අ) ප්‍රකාරව දැන්වීම් පළ කිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන අඩු වටිනාකමකින් යුතු අයිතමයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා හෝ නිතර භාවිතා කරනු ලබන අයිතමයන් මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම අදාල කරගත යුතු වුවද මිලියන 35 ඉක්ම වූ ඉහත කාර්යය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.16 (අ) ප්‍රකාරව ලංසුකරුවන්ට විකල්ප ලංසු ඉදිරිපත් කිරීමට අවසර දෙන්නේ නම් ඒ බව ලංසු ලේඛන වල පැහැදිලිව සඳහන් කල යුතු වුවත් ලංසු කැඳවීමේ ලේඛන වල ඒ බව සඳහන් කර නොතිබියදී ආයතන 02 ක් විකල්ප ලංසු ඉදිරිපත් කර තිබුණි. ලංසුකරු විසින් ඉදිරිපත් | -එම- | -එම- |

| | | |
|---|---|---|
| කරන ලද මෙම විකල්ප ලංසුවක් , ලංසු ඇගයීම් කාර්යය සඳහා සලකා බලනු නොලැබියයුතු වුවත් එක් පෞද්ගලික ආයතනයක් ඉදිරිපත් කර තිබූ විකල්ප ලංසුව ඇගයීමේ කාර්යයේදී සළකා බලා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.<br><br>මෙම විකල්ප ලංසුව ඉදිරිපත් කල ආයතනයට වඩා අඩු වටිනාකමකින් යුතු ලංසු ඉදිරිපත් කල ආයතන 03ක් තිබියදී ඉහත ආයතනයෙන් ඉදිරිපත් කල රු.14,019,655ක් වූ විකල්ප ලංසුව මත එම ආයතනයට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | | |
| (iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.16 (ආ) ප්‍රකාරව විකල්ප ලංසුවක් ලංසු සුරක්ෂණයක් මගින් සනාථ කළ යුතු වුවත් ඇස්තමේන්තුව සමඟ 60% ක විචලනයක් සහිත මෙම ලංසුව වෙනුවෙන් එවැනි ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණු අතර කොන්ත්‍රාත් වටිනාකම මත 5% ක කාර්යසාධන සුරක්ෂණයක් ද ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |

### 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 හි 02(**i**) ඡේදය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකගතාවය මත**,** තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව | වාහන 07ක් පමණක් මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට 2021 සැප්තැම්බර් 28 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඉන් වාහන 04ක් පවරා ගැනීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ අවසරය හිමිවී නොමැත. තවද | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවරාදීමට කටයුතු කළ යුතුය. කෙසේ වුවද, අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන වාහන 24 න් වෙනත් රජයේ ආයතන නමින් ලියාපදිංචි කර තිබුණු වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දැනට ලියාපදිංචි වී ඇති අමාත්‍යාංශයේ අනුප්‍රාප්තික අමාත්‍යාංශය ලෙස 2187/27 දරණ 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් වාහන 03ක ලියාපදිංචි නම වෙනස් කිරීම සඳහා ද ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| (ආ) | ජනාධිපති ලේකම් කාර්යාලය නමින් ලියාපදිංචි කර ඇති Land Rover Discovery වර්ගයේ ජීප් රථයක් අමාත්‍යාංශය ආරම්භයේ සිට නිශ්කාර්යව ගාල් කර පැවතුනි.කොළඹ මහනගර සභාවේ කාර්මික ඉංජිනේරු විසින් එවකට පැවති අභ්‍යන්තර වෙළෙඳ ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2020 මාර්තු 07 දින වාහනයේ පවතින දෝෂ සහ අලුත්වැඩියා කිරීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද , අමාත්‍යාංශය විසින් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල වාහනය සඳහා ඇස්තමේන්තු කැඳවා ඇති අතර ඉදිරියේදී අලුත්වැඩියා කටයුතු ලැබෙන ප්‍රතිපාදන මත සිදුකිරීමට නියමිතය. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය. |

**3.6 අනාර්ථික ගනුදෙනු**

----------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ 2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පිටපත් 350 කින් මුද්‍රණය කර තිබුණු අතර ඒ වෙනුවෙන් දරන ලද පිරිවැය රු.791,910 ක් වී තිබුණි.මෙම වාර්තාවේ ඇතුළත්විය යුතු 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, භාණ්ඩ සමීක්ෂණ වාර්තාව , විගණකාධිපති වාර්තාව වැනි මූලිකාංග ඇතුළත් නොවීමත්, පිටු 831 කින් යුක්ත වාර්තාවේ විශාලත්වය වැඩිවීමත් හේතුවෙන් පාර්ලිමේන්තුව විසින් එම පිටපත් ප්‍රතික්ෂේප කර තිබුණෙන් ඒ සඳහා දරන ලද පිරිවැය අනාර්ථික වැය දැරීමක් වී තිබුණි. | පාර්ලිමේන්තුවට දෙවනුව ඉදිරිපත් කර ඇති පිටපත් 270 අතිරේක පිරිවැයක් නොදරා අමාත්‍යාංශයේ සම්පත් භාවිතා කරමින් මුද්‍රණය කර ඇත. | අදාල වගකිව යුතු පාර්ශවයක් වෙත වගකීම නිශ්චය කර පැවරිය යුතු අතර අදාල බලධාරියාගේ නිර්දේශය මත කාර්යය ඉටු කිරීම සිදු කළ යුතුය. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

(අ) 2020 මැයි මස 07 වන දිනැති අමප/20/0722/218/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහිතව ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කාරක ප්‍රාග්ධනය ලබා දෙමින්, ඔවුන්ට නැවතත් වී මෝල් ක්‍රියාත්මක කරවා විකිණීම සඳහා සතොස ආයතනය වෙත හෝ අරක්ෂිත තොගයක් ලෙස පවත්වා ගෙන යාම සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත සහල් ලබා දීමට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 2020 වර්ෂයේ සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත කඩිනමින් ණය සහන ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සහල් මෝල් හිමි සමුපකාර සමිති සඳහා ප්‍රමුඛතාවය ලබා දීම, 2020 ජනවාරි මාසයේ ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ලබා දුන් සහන පැකේජය තුලින් ණය පහසුකම් ලබා නොගත් මෝල් හිමියෙකු වීම සහ බැංකු වෙත ණය වාරික ගෙවීම පැහැර හැර නොමැති වීම යන නිර්ණායක වලට යටත්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරිණි.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i). | මෙම ව්‍යාපෘතිය යටතේ **2020** වර්ෂය තුල රු.මිලියන **266.7** ක සහ **2021** වර්ෂය තුල රු.මිලියන **109** ක ණය පහසුකම් ලබා දී තිබුණි.මෙම ණය ලබාදීමේදී එක් එක් සහල් මෝල් හිමියන්ගෙන් අයවිය යුතු ණය සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබුණු අතර එක් එක් සමූපකාර සමිති වල සියළු සාමාජිකයින් ලබා ගත් බැංකු ණය වලින් නොගෙවූ මුළු ණය ප්‍රමාණය හා ගෙවිය යුතු මාසික වාරිකය පදනම් කරගෙන එක් එක් සමිතිය සඳහා ව්‍යාපෘතිය යටතේ ලබා දිය යුතු ණය ප්‍රමාණය තීරණය කර තිබුණි.ණය ලබාදිය යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් පවතින ගැටළු හේතුවෙන් අගතියට පත් පාර්ශව විසින් අධිකරණ ක්‍රියාමාර්ගවලට යොමු වී තිබුණු අවස්ථාද නිරීක්ෂණය විය. මේ අනුව ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් **3** වන නිර්ණායකයට පටහැනිව ණය ලබා දී තිබුණු අතර එම තත්වයන් වළක්වා ගැනීම සඳහා අමාත්‍යාංශයේ අවධානය යොමුවී නොතිබුණි. | සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට ණය ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම අමාත්‍යාංශය මඟින් ඍජුව අධීක්ෂණය කිරීම සඳහා මේ වන විට අවශ්‍ය කටයුතු යොදා ඇත. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ව්‍යාපෘති සම්බන්ධ අධීක්ෂණ කාර්යය නිසි ලෙස ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii). | **2020** වර්ෂයේදී පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය සඳහා රු.**10,000,000**ක ණය මුදලක් ලබා දීමට සමූපකාර කොමසාරිස්වරයා නිර්දේශ කර තිබුණද ඒ වෙනුවෙන් රු.**70,000,000** ක් ලබාදී තිබුණි**.** ඒ අනුව සමූපකාර සමිති සඳහා ණය ලබා දීමේදී සමූපකාර කොමසාරිස්වරයාගේ නිර්දේශය ඉක්මවා ණය ලබා දී තිබුණු අතර මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අධීක්ෂණ කාර්යය සිදුවී නොතිබුණි**.** | -එම- | -එම- |

(ආ) දේශීය ව්‍යවසායකයන් බිහිකිරීම හා සවිබල ගැන්වීම ප්‍රධාන අරමුණුකර ගනිමින් රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් රාජ්‍ය වගකීමක් සහිතව දැරිය හැකි මුදලකට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු දේශීය නිෂ්පාදන බෙදාහැරීමේ අරමුණින් කුඩා අලෙවිසැල් ජාලයක් දිවයින පුරා ස්ථාපිත කිරීම සඳහා Q Shop සංකල්පය 2020 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2021 වර්ෂය අවසන් වන විට Q Shop වෙළෙඳසැල් 20 ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණි. අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය තුල මේ වෙනුවෙන් රු.34,319,291 ක මුදලක් ප්‍රතිපූරණය කර තිබුණි. කෙසේ වුවද, 2022 මාර්තු 28 දින වන විට වෙළෙඳසැල් 08 ක් පමණක් ස්ථාපිත කර තිබුණි. | රාජ්‍ය ගිණුම් කාරක සභාව ලබාදුන් උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීම සඳහා අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ව්‍යාපෘති සම්බන්ධ අධීක්ෂණ කාර්යය නිසි ලෙස ඉටු කළ යුතුය. |
| **(ii)** | මෙම අලෙවිසැල් බහාලුම් පෙට්ටි නවීකරණය කර ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් බහලුම් පෙට්ටි 20 ක් සඳහා කරන ලද ආයෝජන මුදල වශයෙන් අමාත්‍යාංශය විසින් 2021 ජනවාරි 26 දින රු.7,200,000 ක් නිදහස් කර තිබුණි.කෙසේ වෙතත් වෙළෙඳසැල් 07 ක් පමණක් ස්ථාපිත කර තිබුණු අතර එම බහාලුම් ප්‍රමාණය මිලදී ගත් බවට තහවුරු කර ගැනීම හෝ | -එම- | අමාත්‍යාංශය විසින් නිදහස් කරන ලද මුදල් යෙදවීමේ ඵලදායීතාවය සම්බන්ධයෙන් පසු විපරම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එම මුදල වියදම් කළ ආකාරය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පසු විපරම් කර නොතිබුණි. | | |
| | **(iii)** අලෙවිසැල් 20 ඉදිකිරීම් සඳහා මධ්‍යම උපදේශන ඉංජිනේරුමය කාර්යාංශය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණ අතර සංස්ථාව විසින් එම ආයතනය සමඟ ලිඛිත ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි. වියදම් ප්‍රතිපූරණය කිරීමේදී මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමු වී නොතිබුණි. | -එම- | ව්‍යාපෘති සඳහා වියදම් ප්‍රතිපූරණය කිරීමේදී ලිඛිත ගිවිසුම් වලට ඇතුළත් වීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමු කළ යුතුය. |
| | **(iv)** අමප/20/1909/313/035 හා 2020 දෙසැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2021 වර්ෂය තුල Q - shop 20 ක් රු.50,000,000 ක ඇස්තමේනතුවක් යටතේ ඉදිකිරීමට නියමිතව තිබුණි. කැබිනට් මණ්ඩල තීරණය අනුව එක් අලෙවිසැලකට ඇස්තමේන්තුගත පිරිවැය රු.2,500,000 ක් වුවද එම මුදල ඉක්මවා අලෙවිසැල් 5 ක් ඉදි කර තිබූ අතර ඒ සඳහා දරන ලද අමතර පිරිවැය රු.10,872,604 ක් වී තිබුණි. | -එම- | ඇස්තමේන්තුගත පිරිවැය නොයික්මවන පරිදි වියදම් දැරීම කෙරෙහි නිසි අධීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කල යුතු රු.1,752,813 ක්, සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කලයුතු රු. 396,041 ක් සහ සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණය කලයුතු රු. 11,088 ක් අදාල ආයතන වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි. | 2021 වර්ෂයේ මෙම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු බොහොමයක පුරප්පාඩු පැවති අතර අදාල නිලධාරීන් එම අරමුදල් වල ලියාපදිංචිය ප්‍රමාද විය. අදාල නිලධාරීන් එම අරමුදල් වල ලියාපදිංචි කර පොදුතැන්පත් ගිණුමේ තැන්පත්කර ඇති වටිනාකම නිරවුල් කරමින් පවතී. | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණය කලයුතු මුදල් නොපමාව ප්‍රේෂණය කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසාර ආර්ථික වර්ධනයක් ඇතිකිරීම තුළින් සහ සහනදායී මිල ක්‍රමයක් තුළින් දරිද්‍රතාව අවම කිරීමේ අරමුණින්, දේශීය නිෂ්පාදකයන් සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා වූ “Q shop” වෙළෙඳසැල් ජාලය ස්ථාපිත කිරීමට අදාල මූලික කටයුතු සිදු කිරීම, වෙළෙඳපොළ භාණ්ඩ හිඟය හා මිල අස්ථාවර වීම වළක්වා ගැනීම තුළින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා “රජවාස” ව්‍යාපෘතිය යටතේ සාප්පු සංකීර්ණ ජාලයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම හා කටයුතු අධීක්ෂණය යන තිරසර සංවර්ධන ඉලක්කයන් ඉටු කර ගැනීමේ ප්‍රගතිය සියයට 50 ට අඩු මට්ටමක පැවතුණි. | දේශීය නිෂ්පාදකයන් සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම මෙන්ම වෙළෙඳපල භාණ්ඩ හිඟය හා මිල අස්ථාවර වීම වලක්වා ගැනීම තුලින් පරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා "රජවාස" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරුණි. නාරාහේන්පිට රජවාස ව්‍යාපෘතිය සාර්ථකව පවත්වාගෙන යනු ලබන අතර මඩකලපුව රජවාස ව්‍යාපෘතිය පැවති වාතාවරණය හමුවේ නිමකිරීමට නියමිත කාලයට නොහැකි විය. | තිරසර සංවර්ධන ඉලක්කයන් ඉටු කර ගත යුතුය. |

## 5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 07 ක් පැවති අතර අමාත්‍යාංශයට අනුයුක්ත ද්විතීයික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 55 ක් වුවද තථ්‍ය කාර්යමණ්ඩලය 24 ක් වීම හේතුවෙන් තනතුරු 31 ක් පුරප්පාඩුව පැවතුනි. | 2022.05.04 දින අධ්‍යක්ෂ ජනරාල් සැලසුම් තනතුරේ පුරප්පාඩුව පුරවා ඇති අතර නීති නිලධාරී/නීති උපදේශක යන නිලධාරීන් විශ්‍රාම ගොස් ඇති අතර නැවත බඳවා ගැනීම සඳහා විස්තීරණ ලකුණු ප්‍රකාශය අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇත.<br>2020/08/09 දින ගැසට් පත්‍රය අනුව 2020.08.20 දින ස්ථාපිත කරන ලද මෙම අමාත්‍යාංශයේ පවතින පුරප්පාඩු පියවීම සඳහා 2021.11.23 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත තනතුරු අනුමත කරගැනීමට යවා ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලය 174 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 276 ක් වීමෙන් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 102 ක අතිරික්තයක් පැවතුනි. | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට අනුයුක්ත කර ඇති නිලධාරින් සඳහා ප්‍රතිපාදන අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යවනු ලැබේ. | අනුමත කාර්ය මණ්ඩලය පවත්වාගත යුතුය. |